# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
# University of Sri Jayewardenepura
# බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
# External Degrees and Extension Courses Unit

## විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම

**2024/2025 වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය (නව/පැරණි නිර්දේශය)**

**(2018/2019/2020/2021/2022 සහ 2023 පුනර් කණ්ඩායම්ද ඇතුලත් වේ)**

2025 ඔක්තෝබර් 19 දින සිට ආරම්භ වීමට නියමිත උක්ත පරීක්ෂණයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර මේ වන විට ශිෂ්‍ය තොරතුරු ගොනුව (student Profile) වෙත පිවිස භාගත (Download) කරගත හැක.

### අපේක්ෂකයන් සඳහා පොදු උපදෙස්

- පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැක්කේ ඔබ විසින් දැනට ලියාපදිංචි වී ඇති භාෂා මාධ්‍යයෙන් පමණි. ලියාපදිංචි භාෂා මාධ්‍යයෙන් හැර වෙනත් මාධ්‍යයකින් පරීක්ෂණය සඳහා පෙනී සිටීම වලංගු නොවේ.
- පරීක්ෂණ මධ්‍යස්ථානය කසල වලින් තොර කලාපයක් වන අතර, විභාග මධ්‍යස්ථානය තුල කසල බැහැර කිරීමෙන් වලකින්න.
- පරීක්ෂණය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම කාල සටහනේ සඳහන් විභාග මධ්‍යස්ථානයට පැමිණිය යුතුය.
- පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී මෙම ප්‍රවේශ පත්‍රය සහ ශිෂ්‍ය වාර්තා පොත රැගෙන පැමිණීම අනිවාර්ය වන අතර එසේ නොමැති අපේක්ෂකයන්ට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.
- විභාග පැවැත්වීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන නීති රීති ඇතුලත් පොත (By-Law) https://external.sjp.ac.lk/exam-rules-and-regulations-guide/ වෙබ් අඩවියෙහි පල කර ඇත. ඒ සම්බන්ධයෙන් දැනුවත්ව පැමිණීම අනිවාර්ය වේ.
- ඔබට යම් රෝගී තත්ත්වයක් පවතී නම් වහාම විභාග නිරීක්ෂක නිලධාරියෙකුට හෝ විභාග ශාලාධිපතිට දැන්විය යුතුය.
- විභාග අපේක්ෂකයන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් විභාග මධ්‍යස්ථානය අසලට පැමිණීමෙන් වැළකිය යුතු අතර පරිශ්‍රය තුළට කිසිදු වාහනයක් ඇතුළු නොකළ යුතුය.
- අවශ්‍ය ආහාර පාන තමා විසින්ම රැගෙන ආ යුතු අතර ඔබට අදාළ විභාග අවසන් වන තෙක් විභාග මධ්‍යස්ථානයෙන් බැහැරව යෑම නොකළ යුතුය.
- විභාග මධ්‍යස්ථානය පැවැත්වෙන භූමියේ වෙනත් පරිශ්‍ර වලට අනවශ්‍ය පරිදි ගමන් කිරීමෙන් වැළකිය යුතුය.
- පරිශ්‍රය තුළට කිසිදු අපද්‍රව්‍යයක් බැහැර නොකළ යුතුය. ඔබ අප සැමගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කිරීම පිණිස සහාය වන්න.

## බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු/වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්

- මෙම පරීක්ෂණය සඳහා පළමුවර පෙනී සිටින **2024 ශිෂ්‍ය කණ්ඩායමේ අපේක්ෂකයන්ට** සහ **2023 අධ්‍යයන වර්ෂයේ උපාධි I පරීක්ෂණය සඳහා වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර අනුමත වූ අපේක්ෂකයන්ට (ප්‍රතිඵල ලේඛනයේ MC සහිත)** පමණක් මෙවර පරීක්ෂණයට පෙනී නොසිටියේ නම් පහත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ හැකිය.

1. බාහිර උපාධි පරීක්ෂණ සඳහා නොපැමිණීමට හේතු /වෛද්‍ය වාර්තා/Absence Justification Form ඉදිරිපත් කිරීමට අපගේ external.sjp.ac.lk යන වෙබ් අඩවියෙහි ඇති අයදුම්පත (සිංහල හෝ ඉංග්‍රීසි යන ඕනෑම මාධ්‍යයකින් ) බාගත කරගෙන නිවැරදිව සම්පූර්ණ කර ඒ සමග අමුණා **“ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ”** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. (ඡායාපිටපත් ළඟ තබාගන්න)

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම**

- රෝගී තත්ත්වයේ ස්වරූපය මත, අසනීප නිසා මුළු විභාගය හෝ විභාගයේ අදාළ කොටසකට හෝ පෙනී නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාගය ආරම්භ වීමට අවම වශයෙන් **විනාඩි තිහකට පෙර** පෙර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිලධාරී වෙත වාර්තා කළ යුතු ය. ඊට අදාළ වෛද්‍ය සහතිකය පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- **පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී දින 14ක් ඇතුළත බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ බාහිර විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.**

2. ඉහත දක්වා ඇති 428 වන සනාතන සභාව මගින් අනුමත කරුණු හොඳින් කියවා බලා ඒ අනුව වලංගු වෛද්‍ය සහතික පමණක් ඉදිරිපත් කළ යුතුය. (ඉහත නිර්ණායකයන්ගේ යම් සංශෝධනයක් සිදුවේ නම් වෙබ් අඩවිය හරහා දැනුවත් කරනු ලැබේ.

3. කිසිදු අවස්ථාවක **විභාග මධ්‍යස්ථානයේදී සේවක භවතුන්ට** හෝ **පිළිතුරු පත්‍රය සමග අමුණා** හෝ **විභාග ප්‍රවේශ පත්‍රය සමග අමුණා විභාග ශාලාවේදී** හෝ භාර දීම **නොකල යුතුය.** එසේ භාරදෙන වෛද්‍ය වාර්තා සම්බන්ධයෙන් බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වගකියනු නොලැබේ.


ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | විද්‍යුත් ලිපිනය- exams.edecu@sjp.ac.lk

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය | විමසීම් - 011 3485404

2025-10-14 | (කාර්යාල වේලාවන් තුල පමණි-පෙ.ව. 8.00-ප.ව4.30)